
දෙවන කලාපය

ISSN - 1391-6785

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි

පළවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජූලි - දෙසැම්බර්


## නෙලූ තේ දල්ලෙන් සරු ආදායමක් ලැබීමට

තමන්ගේ අමු දළු වලට ලැබෙන මිල ප්‍රමාණවත් නැතැයි යනු කුඩා තේ වතු හිමියන් නිරන්තරයෙන් නගන මැසිවිල්ලකි. එමෙන්ම තමන්ගේ දළු බරද අසාධාරණ ලෙස කපා දමන බවටත් ඔවුහු චෝදනා කරති. අඩු වැඩි වශයෙන් මෙහි සත්‍යතාවයක් පැවතිය හැකි වුවද, මේ ලිපියේ අරමුණ කුඩා තේ වතු හිමියන්ගේ පැත්තෙන් මෙම තත්වය යම් තාක් දුරට හෝ මග හරවා ගත හැකි අයුරු පෙන්වා දීමය. මේ සඳහා මුලික වශයෙන් ඔබ කල යුත්තේ නෙලන තේ දල්ලට සිදුවන හානිය හැකිතාක් අවම කරගැනීමයි. හොඳ අමු දළු සැපයීමෙන් උසස් තත්වයේ නිමි තේ වැඩි ප්‍රමාණයක් නිපදවිය හැකි නිසා ඔබගේ අමුදළු වලට වැඩි මිලක් ලබාගත හැකි බව අමතක නොකල යුතුය. මේ සඳහා අවස්ථා කිහිපයකදීම සැලකිලිමත් වීම අවශ්‍ය වේ.

### දළු නෙලීමේදී :

- නියමිත කලට දළු නෙලන්න. එවා මේරීමට ඉඩ නොහරින්න. අරිම්බු මීලඟ වාරය සඳහා ඉතුරු කරන්න.
- නෙලු දල්ලේ මෝරපු කොටසක් තිබේ නම් එය කඩා ක්ෂේත්‍රයට දමන්න. නිෂ්පාදනය සඳහා යෝග්‍ය වන්නේ අංකුරයත් සමග ලපටි දළු 3 හෝ ඊට අඩු ගණනක් (අංකුරයත් සමග ලපටි දළු 2ක් හෝ 1ක්) ඇති කොටස් ය. මෙහිදී අංකුරයත් සමග පත්‍ර 3 ක් ඇති අවස්ථාවේදී 3 වන පත්‍රය මෝරා නොතිබීම ඉතා වැදගත්ය. එසේම තනි වංගි දල්ලක් ඇති විට වුවද මෝරා නොතිබීම අවශ්‍ය යි. අංකුරයක් සමග දළු 4 ක් සහිත කොටස් කම්හලට යැවීමට ඔබට කිසිදු අවසරයක් නැති බව මතක තබා ගත යුතුයි.
- දළු නෙලීමේදී අතේ දළු රැසක් එකතු වන්නට ඉඩ නොහැර වරින් වර අතේ එකතු වන දළු මල්ලට දැමීමෙන් එවා පොඩි වීම අඩු කරගත හැක.
- නෙලන අතර තුර දළු දැමීමට යොදා ගන්නා මල්ල, දළුවලට හොඳ වාතාශ්‍රයක් ලැබෙන, දළු මතුපිට ඇති වතුර එක් රැස් නොවන, සිදුරු සහිත එකක් විය යුතුයි.
- මෙම කුඩය තුල දළු විශාල වශයෙන් එක් රැස් වීමට ඉඩ නොතබා මඩුවට ගෙන ගොස් වරින් වර හිස් කර ගත යුතුය.

### ක්ෂේත්‍රයෙන් දළු ගෙනා පසුව

- දළු කිරන ස්ථානය (දළු මඩුව) බිමට සිමෙන්ති දමා සදාගත් දූවිලි/වැලි වලින් තොර පිරිසිදු ස්ථානයක් වීම වැදගත්ය.
- කම්හලට ගෙන යාමට පෙර දළු තේරීමක් සිදුකරන්න. මෙහිදී තවදුරටත් මේරූ කොටස් හෝ දළු සමග මිශ්‍රව අනවශ්‍ය දෑ (උදා: වල් පැලෑටි) පවතී නම් ඉවත් කරගත හැක.
- ප්‍රවාහනය කිරීම සඳහා මළු වලට ඇසිරීමේදී මළු තුලට විශාල දළු ප්‍රමාණයක් දැමීම නුසුදුසුය. මේ සඳහා වඩාත් සුදුසු වන්නේ ලණු ගෝනියි. සාමාන්‍යයෙන් මධ්‍යස්ථ ප්‍රමාණයේ ලණු ගෝනියකට දළු කිලෝ. 12-14 ට වඩා දැමීම සුදුසු නැත.

### ප්‍රවාහණය:

- දළු නෙලීමේ කටයුතු අවසන් වූ පසු හැකි ඉක්මනින් ආසන්නයේ ඇති කම්හලකට ප්‍රවාහනය කිරීමට පියවර ගත යුතුය.
- ප්‍රවාහණයේදී දළු වලට දූවිලි, ජලය හෝ වෙනත් අපද්‍රව්‍ය මිශ්‍රවීමට ඉඩ නොහල යුතුය.
- ප්‍රවාහණයේදී තේ දළු එක මත එක තට්ටු ගනනාවක් සිටිනසේ ඇසිරීම හෝ දළු ගෝනි මත නැගී යෑම අමු දළුවල ගුනාත්මයට හානිකරය.

ඔබේ ඉඩමෙන් නෙලන තේ දළුවල නැවුම් බව හැකිතාක් ආරක්ෂා කර ගනිමින් එම දළු කම්හල් වලට ලබා දිය හැකි නම් ඔබගේ තේ දල්ලට වැඩි මිලක් ලබා ගැනීම අසීරු නොවනු ඇත.


ජානක මහින්දපාල,
ශ්‍යාමන්ත බණ්ඩාර
ජෙරී ගලහිටියාව




